# ශිෂ්‍ය සටන් සහ මෙඩ්ඩෝ

තෙවන කොටස

*විශ්ව විද්‍යාලයේ දී වෛද්‍ය සිසුන් හැඳින්වුනේ මෙඩ්ඩන් යන සුරතල් නමිනි. මේ ලිපියේ මුල් දෙකොටසින් මා පැවසූ පරිදි "මෙඩ්ඩෝ", "ක්‍රෑමට" රුසියෝ වූහ. මෙනිසා, දිනපතා කම්ස කලිසම් මැදීමට කාලය තිබුනද, සමාජ ආශ්‍රයේ නිරත වීමටත්, පොදු කර්තව්‍යයන් හි නියැලීමටත්, අන් සිසුන් ට සාපේක්ෂව ඔවුන් ට කාලයක් නැති තරම් විය.*

*පොදු ශිෂ්‍ය ප්‍රශ්ණ පිළිබඳව පැණ නැගුණු සටන් වලට මෙඩ්ඩන්ගෙන් ලැබුණේ අවම සහයකි. අසූව දශකයේ මුල් භාගයේ දී ලංකාවේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයක් ආරම්භ කිරීමත් සමගම සියල්ල වෙනස් වන්නට පටන් ගත්තේය. මට ඒ දිනවල හමුවුනු කොළඹ විශ්ව විද්‍යාලයේ මෙඩ්ඩෙක් ගේ කටින් ම පිටවූ පරිදි "ඔය අනිත් අය කරන්නාක් මෙන් ඕන දේටයි එපා දේටයි හැම දෙයට ම සටන් කරන්නේ නැති" මෙඩ්ඩෝ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයට එරෙහි මේ "අතිශය වැදගත්" සටනට ඉත සිතින් ම කැප වූහ!!!*

අද එතැන් සිට........

උතුරු කොළඹ වෛද්‍ය විද්‍යාලය හෙවත් පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයේ සිසුන්ට ද තමන් ගේ විභාගවලට ම පෙනී සිටීමට ඉඩ දී පසුව ඔවුන්ට හොර පාරෙන් කොළඹ විශ්ව විද්‍යාලයේ ලොව පිළිගත් වෛද්‍ය උපාධිය ලබා දීමට කෙරෙමින් තිබුණු කුමන්ත්‍රණයට එරෙහිව කොළඹ වෛද්‍ය පීඨයේ සිසුන් 1983 ජූලි මාසයේ කළ සටන සාර්ථකව අවසන් විය. නමුත් ඒ තාවකාලික ජයක් පමණි. තවත් වසර ගණනාවක් තිස්සේ මේ ප්‍රශ්ණය විටින් විට හිස ඔසවන්නට නියමිත විය.

කොළඹ වෛද්‍ය පීඨයේ සටන එසේ පවතින සමයේ පේරාදෙනිය විශ්ව විද්‍යාලය වසා දමා තිබුණි. එයට හේතු වූ, පසුව දිගු ලිපියකට මාතෘකා කරගත යුතු, සිදුවීම් මාලාව ඉතා කෙටියෙන් මෙසේය. එජාප සහ ජවිපෙ පක්ෂවලට අනුබද්ධ ශිෂ්‍ය කණ්ඩායම් දෙකක් අතර 1982 දෙසැම්බරයේ වීදි සටනක් ඇතිවිය. මේ සම්බන්ධයෙන් දෙන ලද දඬුවම් වලට විරුද්ධව කෙරුණු ශිෂ්‍ය සටනක් මාරාන්තික උපවාසයකට යොමුවිණි. විශ්ව විද්‍යාලය වසා දැමූ නමුත් ශිෂ්‍යයෝ උපවාසය දිගටම ගෙන ගියහ. එය අවසාන වූයේ විද්‍යා පීඨාධිපති ශිෂ්‍යයින් ගේ ප්‍රාණ ඇපකරුවෙකු ලෙස පත්වීමෙනි. එදින රාත්‍රියේ සිසුන් සියළු දෙනාම විශ්ව විද්‍යාල භූමියෙන් එලවා දමන ලදී.

කළු ජූලි කලබල ද, කඩින් කඩ පැවැත්වුණු විභාග වලින් ද අනතුරුව නැවත පේරාදෙනිය විශ්ව විද්‍යාලය ඇරඹුණේ 1984 ජනවාරියේ දී ය. ඒ වන විට විශ්ව විද්‍යාලයේ ප්‍රධාන වෙනස්කම් දෙකක් සිදුවී තිබුණි. පළමුවැන්න නම්, 1983 ජූලි කලබල වලින් පසු දෙමල සිසුන් සැලකිය යුතු ප්‍රමාණයක් පේරාදෙනිය විශ්ව විද්‍යාලය හැරද ගොස් තිබීමයි. දෙවැන්න වූයේ විශ්ව විද්‍යාල භූමියේ ගලහ පාර අද්දර තැපැල් කාර්‍යාලයට යාබදව තිබූ ගොඩනැගිල්ලක පොලිස් ස්ථානයක් විවෘත වී තිබීමයි.

බොහෝ දෙනෙකු සිතුයේ මෙලෙස පොලීසිය පිහිටුවන්නට හේතුව නම් 1983 ජූලි මාසයේ සිදුවුණු ශිෂ්‍ය සටන, උපවාසය සහ ප්‍රාණ ඇපකරු සිද්ධිය බවයි. නමුත් අපට පසුව දැනගන්නට ලැබුනු පරිදි, පොලීසිය පිහිටුවා තිබුනේ 1983 මැයි 11 දින පේරාදෙනිය විශ්ව විද්‍යාලය තුල සිදුවුණු දෙමල ශිෂ්‍යයින්ට කළ පහරදීම් ගැන පත්කළ කෙනත් ලැනරෝල් කොමිසමේ නිර්දේශයක් අනුව විය. මේ කොමිසන් වාර්තාවෙන් ඉහත කලබල ඇතිකළවුන් නිවරුදිව නම්කර තිබුණු නිසාදෝ, එය කිසිදිනෙක ප්‍රසිද්ධ කරන්නට නොයෙදුනි. මා එහි ඇතැම් උද්‍ධෘත කොටස් කිහිපයක් කියවා ඇත්තේ මානව හිමිකම් පිළිබඳ යාපනය විශ්ව විද්‍යාල ආචාර්යවරුන් ගේ සංගමයේ වාර්තාවකිනි.

පොලීසියේ ලොක්කෝ බහුතරයක් ම උපාධිධාරීන් වූව ද, පොලීසිය සහ විශ්ව විද්‍යාල සිසුන් අතර තිබුනේ එතරම් යහපත් සම්බන්ධයක් නොවේ. ඒ දිනවල ශිෂ්‍ය සටන් සරසවි සීමාවෙන් එලියට කර පොවන හැම අවස්ථාවකම පාහේ කුළු පොළු රැගත් පොලීසිය එතැන විය. මීට දශක දෙකක් පණ ඉහත කාලයකදී, විශ්ව විද්‍යාලයේ ක්‍රීඩාගාරය තුල තාවකාලිකව ලැගුම්ගත් හමුද අනුකණ්ඩයක් සහ විශ්ව විද්‍යාල ශිෂ්‍යයින් අතර බරපතල ගුටිකෙලියක් ඇතිවූණු බව මම කියවා ඇත්තෙමි. පේරාදෙනිය ප්‍රධාන පොලිස් ස්ථානය පිහිටා තිබුණේ ද, විශ්ව විද්‍යාල සීමාවෙන් කිලෝ මීටරයකටත් වඩා අඩු දුරකින් උද්භිද උද්‍යානය සහ තානායම අසල නිසා පොලීසියක අවශ්‍යතාවයක් නම් කෙලෙසකවත් නොතිබුණි. මෙනිසා, සාමාන්‍ය පිළිගැනීම වූයේ මෙලෙස පේරාදෙනිය විශ්ව විද්‍යාලය තුල පොලීසියක් පිහිටුවීම අනවශ්‍ය ප්‍රශ්ණ ඇති කරවන්නක් බවයි.

කෙසේ නමුදු, අප නැවත විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනය ඇරඹූ 1984 ජනවාරියේ සිට මාස හයකටත් වඩා කාලයක් ගත වුනද, විශ්ව විද්‍යාල පොලීසිය සම්බන්ධයෙන් කිසිදු ප්‍රශ්ණයක් පැණ නොනැගුණි. පෙර වසරේ පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ ශිෂ්‍ය සංගමයේ යූ.එන්.පී. යට සම්බන්ධකම් නොතිබුනු නියෝජිතයින් සියළු දෙනාගේම පාහේ ශිෂ්‍ය භාවය අහෝසි කර, නව වසරේ ශිෂ්‍ය සංගමය තහනම් කර තිබුණු බැවින් ශිෂ්‍යයින් තුලින් පොලීසියට විරුද්ධව කිසිදු සංවිධාත්මක උද්ඝෝෂණයක් ද දියත් නොවිණි. ලංකාවේ අනෙකුත් විශ්ව විද්‍යාල වල ශිෂ්‍යයෝ තාවකාලික ශිෂ්‍ය ක්‍රියාකාරී කමිටු පිහිටුවා ගෙන ශිෂ්‍ය ප්‍රශ්ණ විසඳාගැනීමට නායකත්වය දෙමින් සිටියද, පේරාදෙනිය විශ්ව විද්‍යාලය තුල දක්නට ලැබුනේ මලානික, අරාජික තත්වයකි. ඒ තත්වය ක්ෂණයකින් වෙනස් වූයේ 1984 වසර මැද මෙඩ්ඩන් ගේ විභාග ප්‍රතිඵල පිටවුනු දිනයේ දී ය.

දිනපතා කලිසම් කමිස මැද ඇඳීම සහ සපත්තු දැමීමට අමතරව අනෙකුත් ශිෂ්‍යයින් ට වඩා මෙඩ්ඩන් ගේ විශ්ව විද්‍යාල ජීවිතයේ වෙනස්කම් කීපයක් විය. ඉන් එකක් නම් ඔවුන් විශ්ව විද්‍යාලය තුල වසර පහක් ගත කිරීමයි. දෙවැන්න නම්, ඔවුන් මුහුණ දෙන මුල් විශ්ව විද්‍යාල විභාගය, සාමාන්‍ය සම්මතය පරිදි පළමු වසරේ අග නොව, දෙවන වසරේ මැද භාගයේ දී පැවැත්වීමයි. මේ හේතුව දක්වමින් "මචං විභාගෙ අත ලඟ, තව මාස අටකට වඩා නැහැ!" යැයි කියමින් කළබළයෙන් දුවන මෙඩ්ඩෝ අපට එකල සිනා ගෙනාවෝය.

එකී දෙවන වසර විභාගය හැඳින්වුනේ ද දෙවන එම්.බී. යන නමින් ය. මෙම විභාගය වසරකට දෙවරක් පැවැත්වුණු අතර එය සමත් වුවායින් පසු තෙවන, සිව්වන සහ පස්වන වසර අවසානයේ දී, ඔවුන් ට තවත් විභාග තුනකට මුහුණ දෙන්නට සිදුවිය. දෙවන එම්.බී. විභාග ය සඳහා මෙඩ්ඩෝ භෞතවේදය (Physiology), ජෛව රසායනය (Bio Chemistry) සහ කාය ව්‍යච්ඡේදනය (Anatomy) යන විෂයයන් ත්‍රිත්වය හදලහ.

වසර අග පැවැත්වෙන විශ්ව විද්‍යාල විභාග වලින් සමත්වන්නන් ගේ නම් සාමාන්‍යයෙන් ඩේලි නිවුස් පුවත් පතේ පලවේ. මගේ නම ද එලෙස සිව් වරක් පත්‍රයේ පල විය. මෙඩ්ඩන් ගේ විභාග සම්බන්ධයෙන් මෙහිදී තිබූ සිනහ උපදවන වෙනස නම් විභාග අසමත්වූවන් ගේ නම් ද අසමත් විෂයයන් සමග ඒ සමගම පුවත් පතේ පලවීමයි. "දුව විභාගේ ඇනටොමි වලින් ෆේල් වෙලා කියලා පත්තරේ තිබුනා!" යැයි සැතපුම් දෙසීයක් දුරින් සිටින මාමා කෙනෙකු තමන් ට පැවසූ බව එකල මෙඩ්ඩියක් වූ එක් සොඳුරු කතක් පසු කලෙක මා සමග පැවසූවාය.

මා පෙර සඳහන් කළ ඒ දෛවෝපගත දිනය උදාවිය. වෛද්‍ය පීඨ සභාව මගින් 1984 ජූලි මස දිනෙක දෙවන එම්.බී. විභාගයේ ප්‍රතිඵල නිකුත් කරන්නට යෙදුනි. එදින රාත්‍රියේ විශ්ව විද්‍යාල පොලීසිය විසින් දෙවන වසර වෛද්‍ය ශිෂ්‍ය පද්මසිරි අබේසේකර වෙඩි තබා මරා දමන ලදී.

සුපුරුදු පරිදි මෙදිනද, රාත්‍රී එකොලහට කැන්ටිම වසන්නට මොහොතකට පෙර මඩ පැහැ කිරි මුසු තක තේ වලින් සප්පායම් වූ අපි අක්බාර්-නෙල් ශාලාවේ කාමරයකට වී තෙලක් බෙදමින් (කයියක් ගහමින්) සිටියෙමු. එක් වරම මහා ගාලගෝට්ටියක හඬ ඇසෙන්නට විය. "ගඟෙන් එගොඩ කොල්ලන් ට පොලීසියෙන් වෙඩි තියනවා" යැයි මහ හඬ නැගුණි.

අපි සියළු දෙනාම පාහේ අක්බාර් පාලම ඔස්සේ දිවගොස් සනාතන සභාව පහත ගෙම්බා කැන්ටිම සහ වීරසූරිය ස්මාරකය අවට බිම් තීරුවට ගියෙමු. වෙඩි වැදුනු ශිෂ්‍යයා

> ***බීමත් වූ මෙඩ්ඩන් පිරිස යලි විශ්ව විද්‍යාල භූමියට පැමිණ තමන්ගේ නේවාසිකාගාර බලා යන අතරතුරේ පොලිස් ස්ථානයේ සිටියවුන් හා කළහයකට පැටළුනහ. මෙඩ්ඩෝ පොලීසියට ගල් ගැසූ බව පැවසේ. මෙඩ්ඩෙකු පොලිස් අත්අඩංගුවට ගත් බව පැවසේ. පොලීසිය ඇතුලට ගත් මෙඩ්ඩාට පොලිස් කාරයෝ පහරදුන් බවත් පැවසේ. ඔහු බේරා ගැනීමට උද්ඝෝෂණය කල අනෙකුත් අයට පොලීසිය විසින් වෙඩි තබන ලද බව පැවසේ. මේ සියල්ල අවසාන වූයේ, තංගල්ලේ සිට පේරාදෙනිය වෛද්‍ය පීඨයට පැමිණ සිටි පද්මසිරි අබේසේකර අවසන් හුස්ම හෙලීමත් සමගය. ඔහු සමග එදින සිටි එක් සිසුවෙක්, එනම් ජවිපෙ හිතවාදියෙකු වූ ජයසිරි, පමණක් මරණ පරීක්ෂණයේ දී සාක්ෂි දුන්නේය. අනිත් මෙඩ්ඩන්ගෙන් සමහරෙක් ඒවන විට බියේ පලා ගොස් ද අනෙක් අය අවමංගල්‍යයට සහභාගී වීමට ගොස් ද සිටියහ.***

රෝහලට ගෙන ගිය බව ආරංචි විය. පොලීසිය දෙසින් වෙඩි හඬ ද, කඳුළු ගෑස් කැනිස්ටර් ගසන හඬ ද ඇසුනි. සිසුවෝ හැකි පරිදි ගල් මුල් එකතු කර පොලීසිය දෙසට වීසි කරන්නට තැත් කළ ද එය නිෂ්ඵල ක්‍රියාවක් පමණක් විය. කඳුළු ගෑස් නොතකා ඉන්නට සමතෙක් නැත. ටික වේලාවකින්ම මගේ දෙනෙතින් කඳුළු වැගිරෙන්නටත්, දැස රිදුම් දෙන්නටත් පටන් ගති. කාගෙන් දෝ ලැබුණු උපදෙස් පරිදි මුහුණ වතුරෙන් සේදූ විට මද සහනයක් ලැබුණි.

ටිකෙන් ටික අපට ආරංචි වූ පරිදි සිදුවී තිබුණේ මෙයයි. එදින, දෙවන එම්.බී. ප්‍රතිඵල නිකුත් කළ දින සවස් වරුවේ මෙඩ්ඩන් පිරිසක් තම දුක හෝ සතුට සමරනු පිණිස චාරිත්‍රානුකූලව මධු පානයකින් සන්තර්පනය වෙන්නට පේරාදෙනිය හන්දියේ තුසිත සිනමා ශාලාව අසල පිහිටි සමාජ ශාලාව (තැබෑරුම) ට ගොස් තිබේ.

මේ වන විට, අද මෙන් රට පුරා ම වයින් ස්ටෝරු හෙවත් බෝතල් කඩ පිහිටුවා නොතිබුණි. චීන අවන්හල් මුවාවෙන් බීර බොන ස්ථාන ද දසත පැතිරී නොතිබුණි. පෙරකී සමාජ ශාලාව 1983 දී පිහිටුවන තෙක්ම පේරාදෙනියේ සිටින්නෙකුට මත්පැන් බොන්නට අවශ්‍ය නම් ඒ සඳහා පේරාදෙනිය තානායමට හෝ මත්පැන් බෝතලයක් මිලදී ගන්නට අවශ්‍ය නම් ඒ සඳහා මහනුවර නගරයේ කොළඹ වීදියට යන්නට සිදුවී තිබුණි. තානායමට ගොස් බොන්නට හැක්කේ සමාජයේ කීප දෙනෙකුට පමණි. එනිසා පේරාදෙනිය අවට ගම්වල සියළු සුරාලෝලීන් දිවා කාලයේ සහ සවස් කාලයේ එක් වූයේ පෙර කී මහනුවර නගරයේ කොළඹ වීදියටයි. රාත්‍රී කාලයට හදිස්සියට ගල් බෝතලයක් ගන්නට අවශ්‍ය වූ අයගේ පිහිටට පැණිදෙනියේ නෙළුම් සිටියේය. අවට ගම් වල ද එවැනි හොර පොලවල් අනිවාර්‍යයෙන්ම තියෙන්නට ඇත. විශ්ව විද්‍යාල ආචාර්‍යවරුන් සහ අනධ්‍යයන කාර්‍ය මණ්ඩලය සඳහා විශ්ව විද්‍යාලය තුලම පීඨ සමාජ ශාලාව (Faculty Club) යනුවෙන් ස්ථානයක් තිබිණ.

තුසිත සිනමා ශාලාව අසල පිහිටි සුරාපාන ස්ථානය ඇත්ත වශයෙන්ම ලියාපදිංචි වී ක්‍රියාත්මක වූයේ ක්‍රීඩා සංගමයක් (Sports Club) වශයෙනි. අද අපි ආර්.එස්.එල්. වැනි සමාජ ශාලාවකට යන විට කරන්නාක් මෙන් මෙහි ඇතුල්වන්නට නම් එක්කෝ සාමාජිකත්වය තිබිය යුතුය නැතිනම් අමුත්තෙක් ලෙස අත්සන් කළ යුතුය. එදා එහි ගිය අපේ මෙඩ්ඩන් කණ්ඩායම ද එසේ කරන්නට ඇත.

මිනිසෙක් මත්පැන් ගනී, මත්පැන් මත්පැන් ගනී, මත්පැන් මිනිසාව ගනී (A man takes a drink, the drinks takes a drink, the drinks take the man) යැයි කියමනක් ඇත. මෙය සදාකාලික, සර්වදේශ සත්‍යයකි. බීමත් වූ මෙඩ්ඩන් පිරිස යලි විශ්ව විද්‍යාල භූමියට පැමිණ තමන්ගේ නේවාසිකාගාර බලා යන අතරතුරේ පොලිස් ස්ථානයේ සිටියවුන් හා කළහයකට පැටළුනහ. මෙඩ්ඩෝ පොලීසියට ගල් ගැසූ බව පැවසේ. මෙඩ්ඩෙකු පොලිස් අත්අඩංගුවට ගත් බව පැවසේ. පොලීසිය ඇතුලට ගත් මෙඩ්ඩාට පොලිස් කාරයෝ පහරදුන් බවත් පැවසේ. ඔහු බේරා ගැනීමට උද්ඝෝෂණය කල අනෙකුත් අයට පොලීසිය විසින් වෙඩි තබන ලද බව පැවසේ. මේ සියල්ල අවසාන වූයේ, තංගල්ලේ සිට පේරාදෙනිය වෛද්‍ය පීඨයට පැමිණ සිටි පද්මසිරි අබේසේකර අවසන් හුස්ම හෙලීමත් සමගය. ඔහු සමග එදින සිටි එක් සිසුවෙක්, එනම් ජවිපෙ හිතවාදියෙකු වූ ජයසිරි, පමණක් මරණ පරීක්ෂණයේ දී සාක්ෂි දුන්නේය. අනිත් මෙඩ්ඩන්ගෙන් සමහරෙක් ඒවන විට බියේ පලා ගොස් ද අනෙක් අය අවමංගල්‍යයට සහභාගී වීමට ගොස් ද සිටියහ.

ඒ එසේ වුවද, පද්මසිරිගේ මරණය විශේෂයෙන් පේරාදෙනිය ශිෂ්‍ය ව්‍යාපාරයද පොදුවේ මුළු විශ්ව විද්‍යාලයම ද නව මගකට යොමු කිරීමට සමත්වූ සිද්ධියක් විය. පලමුවෙන්ම, 1982/83 පේරාදෙනිය මහා ශිෂ්‍ය සභාවේ සිටි එජාපට සම්බන්ධතා නොතිබනු සියළුම ශිෂ්‍ය නියෝජිතයින්ගේ පන්ති තහනමත්, විශ්ව විද්‍යාල ශිෂ්‍ය සභා අහෝසියත් නිසා එතෙක් අරාජිකව තිබූ පේරාදෙනි විශ්ව විද්‍යාලීය ශිෂ්‍ය ව්‍යාපාරයට එදින රාත්‍රී ගලහ පාරේ දී පිහිටුවනු ලැබූ ක්‍රියාකාරී කමිටුවක නායකත්වය ලැබීමයි. තමා 1977 දේශපාලන වේදිකාවල කතා කරද්දී ලද අත්දැකීම් පදනම් කරගෙන "ඔබ තමුන්නාන්සේලා" යැයි සහෝදර ශිෂ්‍යයින් අමතමින් හස්තිනායක සොහොයුරා එදා අපේ ක්‍රියාකාරී කමිටුවේ ආරම්භක කතාව කළ ආකාරය මගේ මතකයේ තවමත් හොඳින් රැඳී තිබේ.

දෙවැන්න, තමන්ගේ රැලේ එකෙක් මළ පසු මෙඩ්ඩෝ වඩාත් ක්‍රියාකාරී ලෙස ශිෂ්‍ය දේශපාලනයට අවතීර්ණ විමයි. එදා මරණ පරීක්ෂණයේදී සාක්ෂි දුන් ජයසිරි ද, නීල් වැනි තවත් සොහොයුරෝ ද තම ජවිපෙ දේශපාලන සබඳකම් නිසාදෝ ශිෂ්‍ය ව්‍යාපාරයේ ද උනන්දුවෙන් නිරත වූහ. මේ දෙදෙනාම අද ජීවතුන් අතර නැත. ජයසිරි ශිෂ්‍යයෙක් ලෙසද, නීල් දෙස්තරවරයෙක් ලෙසද රුදුරු මරණයට මුහුණ දුන්හ.

තෙවනුව, එදා පද්මසිරි ගේ මරණයත් සමගම වාගේ එවකට පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ උපකුලපතිව සිටි උග්‍ර රාජපාක්ෂිකයෙකු වූ ලෙස්ලි පණ්ඩිතරත්නගේ කාලය නිම විය. ඒ වෙනුවට වෛද්‍ය පීඨයේ මහැදුරන් වූ පානබොක්කේ, බස්නායක ආදීන් ඒ පදවිය බාරගත්තෝය. වෛද්‍ය පීඨයේ ග්‍රහණයෙන් විශ්ව විද්‍යාල පරිපාලනය ගැලවුනේ දෙවසරකටත් වඩා කල්ගත වූ පසුය.

මීලඟ කොටසින් කියවන්නා: පද්මසිරි ගේ මරණයෙන් පසු.

ර. චන්ද්‍රසූරිය
<ra.chandra.suriya@gmail.com>